ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ මූල්‍ය සමාගම් පවත්වාගෙන යන බව කියමින් මුදල් වංචා කළ බවට පැවසෙන කාන්තාවක සම්බන්ධයෙන් පුළුල් අවධානයක් මාධ්‍ය සහ සමාජ මාධ්‍ය තුළ ලැබී තිබිණි.

මේ සම්බන්ධයෙන් වාර්තා කරනා මව්බිම පුවත්පත (ඔක්. 10, 2022) එය ඉදිරිපත් කරන්නේ, "හඬපට එළියට, සළුපට අහසට" යන සිරස්තලයෙනි. මෙම අනාවරණය වී ඇතැයි පවසන අසභ්‍ය දෙබස් ඇතුළු හඬ පට සම්බන්ධයෙන් වැඩි දුරටත් පුවත තුළ සඳහන් වේ. එසේම, මෙම කාන්තාව "සුරූපී" යැයි ද පුවත තුළ කිහිප විටකම සඳහන්ව තිබේ.

* මෙම සිරස්තලය සහ අදාළ කාන්තාවගේ බාහිර රූපය ඉස්මතු කරමින් පුවත වාර්තා කිරීම භාවාතිශය (Sensational) යැයි ඔබ නොසිතන්නේ ද?

භාවාතිශය වාර්තාකරණයෙන් වළකිමු!